# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/AB/24/වා.ස්.මා/2025

ප්‍රධාන කාර්යාලය / தலைமை அலுவலகம் / HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2024.08.09


අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ භාර මාණ්ඩලික නිලධාරීන්,

කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

මධ්‍යම ලේඛනාගාරය භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්,

දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

සියළුම ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2025

ඉහත කරුණ සම්බන්ධ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක **COM/Trans/V/වා.ස්.මා/2025** හා 2024.07.29 දිනැති අංක 02/2024 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. (මේ සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ www.pubad.gov.lk වෙබ් අඩවිය බලන්න.)

02. එහි සඳහන් විධිවිධාන අනුව 2025 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ යටතේ සිටින ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගෙන් ස්ථාන මාරු අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව 2025 වර්ෂයේ කළමණාකරන සේවා නිලධාරී සේවය (I,II,III ශ්‍රේණි), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (2,3 පන්ති) , සංවර්ධන නිලධාරී සේවය , රියදුරු සේවය , කාර්යාල සේවක සේවය යන සේවා වලට අයත් වන නිලධාරීන් LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් **http://10.250.1.112/misco** යන වෙබ් ලිපිනයෙන්ද වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් **http://43.224.125.68/misco** යන වෙබ් ලිපිනයෙන්ද පිවිස වාර්ෂික ස්ථාන මාරු මාර්ගගත මෘදුකාංගය හරහා මාර්ගගත අයදුම්පතක් (online application) මගින් ඉල්ලුම් කළ යුතුව ඇති බව කාරුණිකව දන්වමි.

03. එම ස්ථාන මාරු අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (printout) ස්ථාන මාරුව අයදුම් කරන නිලධාරියා විසින් අත්සන් කොට ඔබගේ නිර්දේශය සහිතව 2024.08.23 දිනට ප්‍රථම ( එම අයදුම්පත් සියල්ල 2024.08.31 දිනට ප්‍රථම ඒකාබද්ධ සේවා අංශය වෙත යොමු කළ යුතුව ඇති බැවින්) මා වෙත ඉදිරිපත් කළ යුතුය. එදිනට පසු ලැබෙන අයදුම්පත් සම්බන්ධව වගකියනු නොලබන බවද දන්වා සිටිමි.

04. ඒකාබද්ධ රියදුරු සේවයේ හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ට මාර්ගගත ක්‍රමය ඔස්සේ පෞද්ගලිකව අයදුම් කිරීම අපහසු වේ නම් තම සේවා ස්ථානය තුළින් එය සිදු කළ හැක. ඒ සඳහා අදාළ පහසුකම් ලබාදීමට ආයතන ප්‍රධානීන් විසින් ක්‍රියා කළ යුතුය.


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.l[k] rg@rgd.gov.[lk]

05. පෙර සේවා තොරතුරු මෙතෙක් යාවත්කාලීන නොකළ නිලධරයන් තම පෞද්ගලික MISCO ගිණුම ඔස්සේ පිවිස මෙනුවෙහි ඇති Personal -------Personal Information---- Add New Employee----Employment Details හි Work Place හා Date of Duty assumed at Current Institute හි දත්ත යාවත්කාලීන කළ යුතුය. තවද මෙනුවෙහි Service----History----Transfer History ඔස්සේ නිලධරයා විසින් තමන් ලද වාර්ෂික ස්ථාන මාරුව හා සාමාන්‍ය ස්ථාන මාරු පිළිබඳ සේවා තොරතුරු යාවත්කාලීන කළ යුතුවේ.

06. මීට අමතර වශයෙන් ආයතනයක/සේවා ස්ථාන සමූහය තුළ පවත්නා කාර්යාලයක හෝ කාර්යාලවල වසර 05ට වඩා සේවය කළ නිලධරයන්ගේ තොරතුරු නිවැරදිව ඇතුලත් කල MISCO පද්ධතියට ඇතුලත් කර යාවත්කාලීන කිරීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතු බව දන්වමි.

**07. තවද එක් නිලධාරියෙකුට මාර්ගගත ක්‍රමය ඔස්සේ එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිමි.**

08. එමෙන්ම කාර්යාලයන්හි රඳවා ගැනීමට අවශ්‍ය නිලධාරීන් සහ වෛද්‍ය සහතික මගින් සනාථ කර ඇති බරපතල රෝගාබාධ වලින් පෙලෙන ස්ථාන මාරු නොකල යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කාර්යාල ප්‍රධානීන් විසින් පුද්ගලිකවම සනාථ කල යුතු වන අතර එහි නාම ලේඛනයක් මා වෙත ලැබීමට සලස් වන ලෙසද දන්වා සිටිමි. ඉහත කරුණු සම්බන්ධයෙන් වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීමෙන් අනතුරුව නිකුත් කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලබන බව දන්වමි.

09. සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට කාර්යාල ප්‍රධානීන් විසින් වග බලා ගත යුතු අතර සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු සපයා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳ කාර්යාල ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධරයන් වගකීමට බැඳී සිටින බව දන්වමි.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති(කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව කටයුතු සිදු කෙරෙන බැවින් මෙම ක්‍රියාවලියේදී එම විධිවිධානයන්ට අනුකූලව කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

**ඒ.එච්.එල් ද සොයිසා**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට.
දු.ක. - 0112072016
ෆැක්ස් - 0112889493
විද්‍යුත් තැපැල - **sdrgadmin@rgd.gov.lk**

<u>පිටපත්:-</u>

1. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැ.ගැ.ස.